**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වාර්ෂික නියාමන ගාස්තු ශේෂය රු.82,544,592 ක් වන අතර, ඒ තුළ 2014/15 වර්ෂයන්ට අදාළ ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු රු.81,852,700 ක් පැවතුණි. මෙම ශේෂය අයකර ගැනීමේ හැකියාව පිළිබඳ විධිමත් ඇගයීමක් සිදුකර ඊට අදාළව බොල් හා අඩමාන ණය වෙන් කිරීම් ගැලපුම් සිදු නොකිරීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි නිරූපණය වන ලැබිය යුතු ශේෂයන්හි සාධාරණ වටිනාකම පිළිබඳ අවිනිශ්චිතභාවයක් විගණනයේදී පැන නැගුණි. මේ හේතුවෙන් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි නිරූපණය වන වාර්ෂික නියාමන ගාස්තු ලැබිය යුතු ශේෂයෙහි සාධාරණ වටිනාකම විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. | 2022 ජනවාරි 27 දිනැති අංක PUCSL/Fin/2022/01 දරන ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී ඇමතු ලිපිය මගින් මෙම මුදල ගෙවන ලෙස දන්වා ඇත. තවදුරටත් එම මුදල් නොගෙවන්නේ නම් කොමිෂන් සභාව විසින් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා ඇත. | ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 1.6 නීති, රීති, රෙගුලාසි, කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත | ශ්‍රී ලංකාවේ විදුලිය, ඛනිජතෙල් හා ජලය කර්මාන්ත නියාමනය කිරීම සඳහා 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත මගින් ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් | ජලසේවා කර්මාන්තය නියාමන අවශ්‍යතා සඳහා අවශ්‍ය නෛතික පසුබිම සකස් කිරීම වෙනුවෙන් 2003 වර්ෂයේදී Water Service Reform පනත් කෙටුම්පත සකස්කර | ඛනිජතෙල් හා ජලය කර්මාන්ත නියාමනය කිරීමට අදාළ නීතිමය රාමුව සකස් කර ගැනීමට කටයුතු කළ යුතු වීම |

| | | | | |
|---|---|---|---|---|
| | | සභාවට බලය ලැබී තිබුණද, ඛනිජතෙල් නීතිගත සංස්ථාව හා ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩල පනත් මගින් එම නියාමනය කිරීමේ නීතිමය රාමුව සකස් වී නොතිබුණි. කොමිෂන් සභාව ස්ථාපිත කර වර්ෂය 19 කට අධික කාලයක් ගතවී තිබුණත් ඛනිජතෙල් හා ජල කර්මාන්තය කොමිෂන් සභාවේ නියාමනයට යටත් වන පරිදි අදාළ පනත් සංශෝධනය කර ගැනීමට නොහැකි වී තිබුණි. | 2009 ජූලි 23 දින නීති කෙටුම්පත් දෙපාර්තුමේන්තුවට ඉදිරිපත් කළත් ඒ සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් නිර්දේශ මත තාවකාලිකව නතරවී තිබුණි. නමුත් 2017 මැයි 02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදි ගනු ලැබූ තීරණය මත නැවත මෙම කර්තව්‍ය ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව සාක්ෂි ලබා ගනිමින් උපදෙස් වාර්තාවක් සකස්කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා 2021 ජූනි 25 දින ජල සම්පාදන අමාත්‍යාංශය වෙත භාරදී ඇත. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබූ විගස නීති කෙටුම්පත් කිරිම ආරම්භ කිරීමට බලාපොරොත්තුවේ. | |
| (ආ) | 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ I හා II ඡේද | ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය හා වැටුප් ව්‍යුහය ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා, කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සමඟ මුදල් ඇමතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත සංදේශයක් ඉදිරිපත් කර අනුමත කර ගත යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටද එම කටයුතු සිදු නොකර පහත සඳහන් පරිදි වියදම් කර තිබුණි. | | |
| | | (i) ආයතනයේ කාර්ය මණ්ඩලය වෙත දීමනා වර්ග 11 ක් යටතේ එකතුව රු.45,873,483 ක් ගෙවා තිබුණි. | 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව පනතේ 12(1)(ඇ) වගන්තිය අනුව කොමිෂන් සභාව විසින් | පිළියෙල කර ඇති ආයතන පරිපාලන හා කාර්ය පටිපාටි සංග්‍රහය සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත |

| | | |
|---|---|---|
| | එහි කාර්ය මණ්ඩලයට පාරිශ්‍රමික ගෙවිය යුතු අනුප්‍රමාණ නියම කළ යුතු බවද, එහි 3 වන වගන්තිය මගින් 12(1) වගන්තියේ සදහන් කර ඇති යම් කාරණයක් හෝ සියලු කාරණා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි බවද, සදහන් කර ඇත. ඒ අනුව කොමිෂන් සභාව විසින් අදාළ මූල්‍ය රීති ඇතුළත් කර අත්පොත් හා මගපෙන්වීම් සකස් කර කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන ඇත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සිදු කළ සාකච්ඡාවේදී අවසන් එකගතාවය වූයේ මෙම කොමිෂන් සභාව අනෙකුත් කොමිෂන් සභා සමග සැසදීමේදී සුවිශේෂී ආයතනයක් බැවින් මෙය ස්ථාපිත කර තිබෙන පනතේ විධිවිධාන ඒ අනුව සකස් වී ඇති නිසා එම පනතේ විධිවිධාන අනුව දැනට ක්‍රියාත්මකව පවතින තත්ත්වය සුදුසු බවත්, මෙම සම්මුඛ සාකච්ඡාවේදී පැවති සටහන් ඉදිරිපත් වුවහොත් එය වෙනත් ආයතන ද පූර්වාදර්ශ ලෙස භාවිතා කිරීමට ඉඩ ඇති බැවින් අදාල සම්මුඛ සාකච්ඡා සටහන් ලබාදිය නොහැකි බවත්ය. | යුතු වීම. |
| (ii) සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා මාසිකව රු.40,000 ක් බැගින්ද, කළමනාකරණ තනතුර සඳහා මාසිකව රු.5,000 ක් බැගින්ද, රියදුරු තනතුර | ඉහත පරිදි | ඉහත පරිදි |

| | | |
|---|---|---|
| සඳහා මාසිකව රු.2,500 ක් බැගින්ද, ගමන් වියදම් ලෙස ගෙවීමට ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටි සංග්‍රහය අනුව විධිවිධාන සලසා තිබුණි. එම විධිවිධානවලට භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන එකතුව රු.8,880,000 ක් ගෙවා තිබුණි. | | |
| (iii) කොමිෂන් සභාවේ සේවයේ නියුතු ස්ථිර සේවකයන් සඳහා උපරිමය රු. මිලියන 5 ක සහ ආපසු ගෙවීමේ කාලය අවුරුදු 5 යටත්ව වාහන සඳහා ණය යෝජනා ක්‍රමයක් 2018 මාර්තු 15 දිනැති අංක 212 කොමිෂන් සභා පත්‍රිකාව මඟින් අනුමත කර තිබුණද එම යෝජනා ක්‍රමය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් දෙදෙනෙකු විසින් ලබාගෙන තිබුණු එකතුව රු.6,500,000 ක ණය මුදල වෙනුවෙන් පොලිය ලෙස රු.248,088 ක් කොමිෂන් සභාව විසින් බැංකුව වෙත ප්‍රතිපූර්ණය කර තිබුණි. | ඉහත පරිදි | ඉහත පරිදි |
| (iv) කොමිෂන් සභාවේ ස්ථිර සේවකයන් සඳහා රු. මිලියන 8 ක උපරිම සීමාව හා අවුරුදු 15 ක කාල සීමාවට යටත්ව නිවාස හා දේපල ණය යෝජනා ක්‍රමය 2018 අගෝස්තු 18 දිනැති අංක 220 දරන කොමිෂන් සභා පත්‍රිකාව මඟින් අනුමැතිය ලබා දී තිබුණි. ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය | ඉහත පරිදි | ඉහත පරිදි |

| | | | | |
|---|---|---|---|---|
| | | ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් 18 දෙනෙකු විසින් ලබා ගන්නා ලද එකතුව රු.78,140,610 ක නිවාස හා දේපළ ණය වෙනුවෙන් රු.3,157,723 ක් පොලී වශයෙන් කොමිෂන් සභාව විසින් බැංකුව වෙත ප්‍රතිපූර්ණය කර තිබුණි. | | |
| (ඇ) | 2015 මැයි 25 දිනැති අංක PED - 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.3 ඡේදය | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව නිල වාහන හිමි නිලධාරීන්ට ගෙවිය යුතු ඉන්ධන ලීටර් ප්‍රමාණයට අදාළ වටිනාකම ඉක්මවා කොමිෂන් සභාවේ අනුමැතිය මත ඉන්ධන දීමනා ගෙවා තිබුණි. | 2002 අංක 35 දරන මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 12 වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ කාර්යභාරයන් සලකා බලා අවශ්‍ය ඉන්ධන සීමාවන් කොමිෂන් සභාව විසින් අනුමත කර එම අනුමැතීන්ට යටත්ව මෙම ගෙවීම් කර ඇත. | පිළියෙල කර ඇති ආයතන පරිපාලන හා කාර්ය පටිපාටි සංග්‍රහය භාණ්ඩාගාරයට ඉදිරිපත් කර අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 හා 3.3 ඡේද | මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් භාවිතයට ගෙන තිබූ වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවක් සිදු කර හෝ එහි වාහනවල ඉන්ධන පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් වූ සටහන් පවත්වා නොතිබුණි. | මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ භාවිතයේ පවතින වාහනවල ඉන්ධන වියැකීම සම්බන්ධව කිසිම පැමිණිල්ලක් අදාළ රියැදුරන් විසින් මේ දක්වා ඉදිරිපත් කර නොතිබුණු බැවින් ඒවායේ ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. කෙසේ වෙතත් මෙම විගණන වාර්තාවේ සඳහන් පරිදි වාහනවල ඉන්ධන පරීක්ෂාවක් සිදුකර අදාල සටහන් ලොග් සටහන් පත්‍රවල සටහන් කර එම සටහන් පවත්වාගෙන යාමට නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | මු.රෙ. 396 (ඇ) | නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ එකතුව රු.29,858 ක් වටිනා කල් ඉකුත් වූ චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව 2022 ජුනි 27 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | මෙම චෙක්පත් 4 සම්බන්ධව මු.රෙ.396(ඇ) හි සඳහන් ක්‍රියාමාර්ග මේ වන විට ගෙන ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 141,703,508 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 146,775,974 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,072,466 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වෙනත් ආදායම් සියයට 8 කින් අඩුවීම වීම සහ උපදේශන සේවා වියදම් හා මෙහෙයුම් වියදම් පිළිවෙලින් සියයට 393 කින් හා සියයට 99 කින් වැඩි වීම හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **තත්කාර්ය අතුරු අග්‍රිම** | | |
| (i) | මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සඳහා වැය කළ වියදමෙන් සියයට 62 ක් හෙවත් රු.58,485,262 ක් අවස්ථා 166 කදී නිලධාරීන් 20 දෙනෙකුට හා ආයතන 04 ක් වෙත තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි .කොමිෂන් සභාවේ මූල්‍ය උපදෙස් සංග්‍රහය අනුව එක් වරකදී කිසියම් කාර්යයක් වෙනුවෙන් නිලධාරියෙකුට උපරිම වශයෙන් රු.20,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දිය හැකි වුවත්, කොමිෂන් සභා කාර්යාලය විසින් එම සීමාව තුළ එක නිලධාරියකුට රු.12, 000ක හා රු.18, 125 ක්ද, තවත් නිලධාරියෙකු වෙත රු.7,500 ක් වශයෙන් | මෙම වැඩසටහන් මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්ම නොවන අතර පනතේ නියම වී තිබෙන බලතල හා කර්තව්‍ය අපක්ෂපාතීව ස්වාධීනව විනිවිද පෙනෙන්නා වූ අයුරින් ඉටුකිරීමේ අරමුණ මුල් කරගෙන සිදුකර තිබෙන ක්‍රියාකාරකම් වේ. | කොමිෂන් සභාවේ මූල්‍ය උපදෙස් අත්පොතට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | තත්ත්කාර්ය අතුරු අග්‍රිම තුනක් පමණක් නිකුත් කර තිබුණි. කොමිෂන් සභාවේ මූල්‍ය උපදෙස් සංග්‍රහයට පටහැනිව කොමිෂන් සභා කාර්යාලය විසින් අවස්ථා 163 කදී නිලධාරින් 20 දෙනෙකු අතර රු.20,750 ක සිට රු.1,157,658 ක් දක්වා වූ පරාසක ප්‍රමාණයන්ගෙන් තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. | | |
| (ii) | කොමිෂන් සභාවේ කළමනාකරණය විසින් තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීමේදී කොමිෂන් සභාවේ මුදල් තාවකාලිකව වංචාවක් සිදු නොවන ආකාරයට නිකුත් කළ යුතුව තිබුණි. නමුත් කොමිෂන් සභා කාර්යාලය විසින් නිලධාරින් වෙත අසාමාන්‍ය ප්‍රමාණවලින් තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණු බැවින් එවැනි පාලනයක් සිදු වී තිබුණු බව තහවුරු නොවීය .එම නිලධාරින් 20 දෙනාගෙන් නිලධාරින් 14 දෙනෙකු වෙත රු.1,261,693 කට වැඩියෙන් තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. එසේ නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිමවලින් නිලධාරින් 19 දෙනෙකු විසින් රු.5,682 ක සිට රු.1,543,864 ක පරාසයක ප්‍රමාණවලින් එම මුදල් කිසියම් කාලයක් අතරඳවා ගෙන නැවත මුදලින්ම පියවා තිබුණි. නිවැරදි ඇස්තමේන්තුවක් රහිතව කාර්යයට අදාළ වන මුදල ඉක්මවා තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරිම නිසා මෙසේ අත්තිකාරම් කාර්යය නිමවීමෙන් පසුව ආපසු මුදලින් තැන්පත් කිරීමට සිදු වී තිබුණි. අදාළ නිලධාරීන් | මෙම තත්ත්වය රටේ පැවති වාතාවරණය හා දුර ප්‍රදේශවල පැවති ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවී ඇත . එහෙත් 2022 වර්ෂයේදී මෙම තත්ත්වය ඉටුනොවීම සඳහා මේ ගැන සකස් කළ නව නීති ඇතුළත් මූල්‍ය උපදෙස් සංග්‍රහයේ සංශෝධනය විගණන හා කළමණාකරණ කමිටුවේ නිරීක්ෂණයන්ද මත ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය අනුමැතිය සඳහා කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත. | ඉහත පරිදි |

| | | | |
|---|---|---|---|
| | විසින් එම මුදල් තාවකලිකව වංචාවන් සිදු කර නොමැති බව තහවුරු කිරීමට ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | | |
| (iii) | නිලධාරින් හතර දෙනෙකු වෙත නිකුත් කර තිබුණු තත්ත්කාර්ය අතුරු අග්‍රිම වලින් එකතුව රු.677,279 ක් 2022 මැයි 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | මෙම මුදල් පුද්ගලයින් නමට ගෙවා තිබුණත් ඒවා සියල්ල ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මේ අනුමැතිය මත සිදු කර ඇත. ඉදිරියේදි මෙවැනි වියදම් සිදු නොවීම සඳහා අත්තිකාරම් ගෙවීම සම්බන්ධ විධිවිධාන විධිමත්කර ඇත. | ඉහත පරිදි |
| (iv) | කොමිෂන් සභාවේ මූල්‍ය උපදෙස් සංග්‍රහයේ 12.8.3(b)(iii) ප්‍රකාරව කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ට පමණක් තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කළ හැකිව තිබුණත්, එයට පටහැනිව කොමිෂන් සභා කාර්යාලය විසින් එකතුව රු.3,601,090 ක් අවස්ථා 14 කදි බාහිර ආයතන 04 ක් වෙත තත්ත්කාර්ය අතුරු අග්‍රිම වශයෙන් නිකුත් කර තිබුණි. එක් ආයතනයක් වෙත අවස්ථා දෙකකදී ගෙවිය යුතුව තිබුණු එකතුව රු.331,100 ක වියදම වෙනුවෙන් රු.413,200 ක තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි .ඒ අනුව කොමිෂන් සභාවේ රු.82,097ක අරමුදල් බාහිර පාර්ශවයන් විසින් අවිධිමත් ලෙස පරිහරණය කර ගැනීමට හැකියාව ලැබී තිබුණි . | විවිධ සේවා සඳහා අත්තිකාරම් වශයෙන් ආයතන වෙත ලබා දී ඇති අතර, එම ගිවිසුම්ගත සේවා අවසානයේදි අප්‍රමාදව පියවා ඇත. | ඉහත පරිදි |
| (v) | කොමිෂන් සභාවේ මූල්‍ය උපදෙස් සංග්‍රහයේ 12.8.3(b)(iv) ප්‍රකාරව තත්ත්කාර්ය අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමේ කාර්ය අවසන් වී දින 03 ක් ඇතුළත එම අත්තිකාරම නිරවුල් කළ යුතුව | මෙම තත්ත්වය රටේ පැවැති වාතාවරණය හා දුර ප්‍රදේශවල පැවැති ක්‍රියාකාරකම් හේතුවෙන් සිදු වී තිබුණි. එහෙත් 2022 වර්ෂයේදී මෙවැනි තත්ත්වයක් ඉටු නොවීම | ඉහත පරිදි |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. කොමිෂන් සභාව විසින් අවස්ථා 15 කදී නිලධාරීන් තිදෙනෙකු වෙත නිකුත් කර තිබුණු එකතුව රු.6,025,153 ක අතුරු අග්‍රිම දින30 ක සිට දින 270 ක් පරාසයක ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි. | සඳහා මේ සම්බන්ධයෙන් සකස් කළ නව නීති ඇතුළත් මූල්‍ය උපදෙස් සංග්‍රහය සංශෝධන කර කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමය කටයුතු කරනු ලැබේ. | |
| (vi) | නිලධාරීන්ගේ ගමන් වියදම් දීමනා කොමිෂන් සභාවේ කාර්යාලයේ සාමාන්‍ය වියදම් පරිපාටිය අනුව සිදු කළ යුතුව තිබුණත්, එම වියදම්ද හදිසි ගෙවීම් ලෙස සලකා තත්කාර්ය අතුරු අග්‍රිමයෙන් පියවා තිබුණි 2021 .වර්ෂයේදී පවත්වා තිබුණු මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් 09 ක් වෙනුවෙන් නිලධාරීන් 10 දෙනෙකු සහභාගී වී තිබුණු අතර, ඔවුන්ගේ යැපීම් හා සංයුක්ත දීමනා ලෙස එකතුව රු.1,809,050 ක් තත්කාර්ය අතුරු අග්‍රිමවලින් පියවා තිබුණි . | මෙම මුදල් පුද්ගලයින්ගේ නමට ගෙවා තිබුණත්, ඉදිරියේදී මෙවැනි වියදම් සිදු නොවීම සඳහා ඇත්තිකාරම් ගෙවීම් සම්බන්ධ විධිවිධාන විධිමත් කර ඇත. | කාර්ය මණ්ඩලයට අදාළ වියදම් සාමාන්‍ය ගෙවීම් ක්‍රමවේදය අනුව සිදු කළ යුතු විම. |

**3.2 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැර වීම.**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 දෙසැම්බර් 03 දිනැති අංක 260 දරන කොමිෂන් සභාවේ රැස්වීම් වාර්තාවේ 1 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර සභාපතිවරයා වෙනුවෙන් වාහනයක් රු.375,000 ක් නොඉක්මවන පරිදි ලබා ගැනීමට තීරණය කර තිබුණි. මෙම කුලී වාහනය ලබා ගැනීම සඳහා 2021 දෙසැම්බර් 08 දින තාක්ෂණ ඇගැයීම් කමිටුව සඳහා සාමාජිකයින් තිදෙනෙකු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත්කර තිබුණි. 2021 දෙසැම්බර් 27 දින ප්‍රසම්පාදන කමිටුව විසින් ටෙන්ඩර් ලියකියවිලි සමාලෝචනය කර තිබුණු අතර, එදින එම ටෙන්ඩර් ලියකියවිලි අනුමත කර තිබුණි. කුලී පදනම මත වාහනයක් ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන දැන්වීම 2021 | | |

දෙසැම්බර් 28 දින Daily News පුවත් පතේ පමණක් පළකර තිබුණි. ඒ අනුව ලංසු දෙකක් ඉදිරිපත් කර තිබුණි. 2022 ජනවාරි 11 දින ප.ව.2.30 ට ලංසු විවෘත කර තිබුණු අතර ඒ සඳහා ලංසුකරුවන් සහභාගී වී නොතිබුණි. 2022 මැයි 18 දින ප්‍රසම්පාදන කමිටුව විසින් මාසික වාහන කුලිය රු.375,000 ක් ලෙස ඉදිරිපත් කළ ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරිමට තීරණය කර තිබුණි. ඒ අනුව 2022 ජුනි 08 දින කොන්ත්‍රාත් ගිවිසුකට එළඹ තිබුණි. එම ගිවිසුම අනුව අංක WP KB-2828 දරන Benz Mercedes CLS 350 වාහනය ලබා ගැනිමට එකඟ වි තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (අ) | එළඹ තිබුණු ගිවිසුම අනුව කොන්ත්‍රාත්කරුගේ ආයතනයේ ලියාපදිංචි අංකය දක්වා නොතිබුණු අතර, එම සමාගමේ අධ්‍යක්ෂවරයෙකුද අත්සන් කර තිබුණත්, ඔහුගේ නම හා හැඳුණුම්පත් අංකය සඳහන් නොකිරිම නිසා ගිවිසුමේ වලංගුභාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | මෙම ගිවිසුමට අදාළ පාර්ශවය විසින් නිසියාකාරව තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා ගිවිසුම ක්‍රියාත්මක කර නොමැත. එම නිසා කොමිෂන් සභාවට මූල්‍යමය අලාභයක් සිදු වී නැත | කොන්ත්‍රාත් ගිවිසුම අහෝසි කළ යුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ ගමන් සඳහා 2021 දෙසැම්බර් 07 දින සිට 2022 ජුනි 30 දින දක්වා කාලය වෙනුවෙන් වෙළෙඳපොල මිල රු.375,000 කට 2005 වර්ෂයේ නිෂ්පාදිත අංක wp KB-2828 දරන Benz Mercedes CLS 350 වර්ගයේ වාහනය පුද්ගලයෙකුගෙන් ඉන්ධන හා රියදුරු නොමැතිව මාසික කුලී පදනම මත ලබා ගෙන තිබුණි. මාසික කුලී වශයෙන් 2021 දෙසැම්බර් 07 දින සිට 2022 මැයි 31 දින දක්වා කාල පරිච්ඡේදයට එකතුව රු.2,187,475 ක් ගෙවා තිබුණි. | 2021 දෙසැම්බර් 03 දින රැස්වූ කොමිෂන් සභාව විසින් 2021 දෙසැම්බර් 01 දින සිට වර්ෂයකට කාලයක් සඳහා රු.375,000 ක උපරිම මිලක් යටතේ වාහනයක් කුලියට ගැනීමට තීරණය කර තිබුණි.<br>මිල සැසඳුම් ක්‍රමය යටතේ වාහනයක් කුලියට ගැනිම සිදු කර තිබුණු අතර, රු.375,000 ක මාසික ගාස්තු ගෙවිමට කොමිෂන් සභාව අනුමත කර තිබුණු අතර, එම ගෙවීම් අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු විම |
| (ඇ) | විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය බලතල පැවරීමේ ලේඛනය අනුව ඉහත සඳහන් ගෙවීම් කිරිමට අධිකාරී බලය ශ්‍රී ලංකා | ඉහත පරිදි | මු.රෙ.135 යටතේ වූ මූල්‍ය බලතල පැවරිම යටතේ වූ |

| | | | |
|---|---|---|---|
| | මහජන උපයෝගීතා කොමිෂන් සභාවට පැවැරී තිබුණත්, ඉහත සඳහන් රු.2,187,475 ක ගෙවීම් කිරීම සඳහා කොමිෂන් සභාවේ අධිකාරී බලය ලබා ගෙන නොතිබුණි. | | නිලධාරීන් විසින් සිදු කළ යුතු වීම. |
| (ඇ) | ඉහත සඳහන් මූල්‍ය බලතල පැවරීමේ ලේඛනය අනුව වාහන මාසික කුලී ගෙවීම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කළ යුතුව තිබුණත්, විගණනයට ඉදිරිපත් කළ ගෙවීම් වවුචර්වල ඔහු විසින් අනුමත කර තිබුණු බව සනාථ නොවීය. | ඉහත පරිදි | ඉහත පරිදි |
| (ඉ) | විධිමත් අධිකාරී බලයක් හා විධිමත් අනුමැතියකින් තොරව ඉහත සඳහන් එකතුව රු.2,187,475 ක් ගෙවීම් සඳහා අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) විසින් ගෙවීම් නිර්දේශ කර තිබුණි. එම නිර්දේශ කිරිම සඳහා ඔහු විසින් පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | | |
| (i) | සේවය සඳහා යොදවා තිබුණු අංක wp KB-2828 දරන Benz Mercedes CLS 350 වර්ගයේ වාහනය 2021 දෙසැම්බර් 07 දින සිට 2022 ජනවාරි 25 දින දක්වා කාලය වෙනුවෙන් වෙනත් ආයතනයක් සතු බව මෝටර් වාහන දෙපාර්තමේන්තුවේ වාහන ලියාපදිංචි කිරීමේ සහතිකය අනුව සනාථ වේ. එමෙන්ම 2022 ජනවාරි 26 දින සිට එම වාහනයේ අයිතිය 2022 ජුනි 08 දින කොමිෂන් සභාව විසින් ගිවිසුම් අත්සන් කළ සමාගම වෙත පවරා තිබුණි. ඊට අදාළ තොරතුරු කොමිෂන් සභාව සතුව තිබියදී එම වාහනය වෙනුවෙන් වාහනය අයිති සමාගම වෙත නොගෙවා වාහන අයිතිය තහවුරු කර නොගත් පුද්ගලයෙකු වෙත ගෙවීම් කර තිබුණි. | මෙම වාහනය අලෙවි කර දෙන මෙන් එවකට හිමිකරු වූ සමාගම විසින් පෞද්ගලික ආයතනයක් වෙත භාර දී තිබුණු අතර, 2021 දෙසැම්බර් 06 දින වාහන කුලියට සැපයූ කොන්ත්‍රාත්කරු වෙත වාහනය විකුණා ඇත. නමුත් මෙහි පරිම අයිතිය මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබා ගත යුතු වුවත්, එසේ සිදු වී නොමැත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු විම |
| (ii) | රජයේ චෙක්පතක් නිශ්චිතව සඳහන් කළ නමකට | මෙහි ආදායකයා විසින් ඔහුගේ නමට මුදල් හෝ | සුළු මුදල් හැර අනෙකුත් සියළු |

| | | | |
|---|---|---|---|
| | ආදායකයාගේ ගිණුමට පමණක් ලෙස රේඛනය කර ගෙවීම් කළ යුතුව තිබුණත්, මෙම වාහන කුලී ගෙවීම්ට අදාළ චෙක්පත්, මුදල් චෙක්පත් වශයෙන් ලියා වාහනයේ නිත්‍ය අයිතිකාර සමාගම නොවන හා සමාගමේ ලිඛිත අනුමැතියකින් තොරව වෙනත් පාර්ශවයක් වෙත ගෙවීම් කර තිබුණි. වවුචර්යේ සඳහන් චෙක්පත් අංකය යටතේ වූ ගෙවිය යුතුව තිබුණු වටිනාකම රු.2,187,425 ක් වී තිබුණත්, බැංකු ප්‍රකාශනය අනුව එම චෙක්පත්වලට අදාළව එකතුව රු.3,061,165 ක් ගෙවා තිබුණි. ඒ අනුව ගෙවීම් වවුචරයේ සඳහන් චෙක්පත් වටිනාකම ඉක්මවා රු.873,739.87 ක් ගෙවා තිබුණි. | මුදල් චෙක්පත් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. ඒ අනුව නියමිත මුදල් මුදලින් ගෙවා ඇත. නියම අයිතිකරුට මුදල් ලැබුණු බව ඔහු විසින් ලබා දුන් මුදල් ලබාගත් බවට තහවුරු ඉදිරිපත් කර ඇත. | ගෙවීම් රේඛනය කළ චෙක්පත් මගින් පමණක් සිදු කළ යුතුවීම. |
| (iii) | මාසික වාහන කුලිය සඳහා ඉදිරිපත් කර තිබුණු ඉන්වොයිස් පත්‍රයේ සේවා සැපයුම්කරුගේ නම, ලිපිනය, දුරකථන අංකය හා අදාළ මුදල ඉල්ලුම් කරන්නාගේ අත්සන හෝ නොතිබුණි. එම ඉන්වොයිස් පත කොමිෂන් සභාවේ කාර්යාලය විසින් පරිගණකය ආශ්‍රයෙන් පිළියෙල කර තිබුණු බව නිරීක්ෂණය විය. එම ඉන්වොයිස්පතේ වාහන කුලී ගෙවිය යතු කාල පරිච්ඡේදය හා ගාස්තුව සඳහන් කර තිබුණු අතර, මුදල් චෙක්පතක් රේඛනය නොකර පුද්ගයෙකු වෙත ගෙවන ලෙස දක්වා තිබුණත්, එහි කවුරුන් විසින් එම ඉල්ලිම සිදු කළාද යන්න ගැනද නොසලකා අධ්‍යක්ෂ මානව සම්පත් විසින් ගෙවීම් නිර්දේශ කර තිබුණි. | මෙම ආදායකයා විසින් මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තිබුණු මිල ඉදිරිපත් කිරීමේ කොන්දේසි අංක 6 යටතේ දක්වා තිබුණු Payment should be made in cash or favoring not crossed යන්නට සඳහන් විම මත මුදලින් ගෙවීම් කර ඇත. | ඉදිරිපත් කරනු ලබන ලේඛනවල නිවැරදිතාවය තහවුරු කර ගෙන වගකීමෙන් යුතුව කටයුතු කිරිම |
| (iv) | රජයට සේවාවක් මනා ලෙස ඉටු කළ බවට අනුමත කිරීමේ නිලධාරීගේ විධිමත් අනුමැතියක් මත ගෙවීම් සිදු කළ යුතුව තිබුණත්, එම සේවා ලබා ගැනීමට පෙර මාසයේ ආරම්භයේදී මෙම ගෙවීම් සිදුකර තිබුණි. ඒ අනුව | ගෙවීම් සඳහා ලබාගත් අනුමැතින් ඉදිරිපත් කර ඇත. | සේවාව ලබාගත් පසුව ගෙවීම් කළ යුතු විම. |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම් සඳහා විධිමත් අනුමැතියකින් තොරව සිදු කර තිබුණි. | | |
| (v) | 2022 ජනවාරි 07 දිනැති අංක 6577 ගෙවීම් වවුචරය මගින් අදාළ පුද්ගලයා වෙත 2022 ජනවාරි මාසය සඳහා වාහන කුලී ලෙස රු.375,000 ක් ගෙවා තිබුණි. එම ගෙවීම් වවුචරයේ පිළියෙල කළ බවට, පරීක්ෂා කළ බවට, සහතික කළ බවට, ගෙවීම් අනුමත කළ බවට හා එම මුදල භාරගත් බවට කිසිවෙකු අත්සන් කර නොතිබුණි. එසේ වූ ගෙවීම් වවුචරයකින් නිකුත් කර තිබුණු අංක 716550 දරන චෙක්පතින් බැංකුව විසින් එම වවුචරයේ සඳහන් වටිනාකම රු.98,440 කින් ඉක්මවා රු.473,440 ක් ගෙවා තිබුණි. | කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් රියදුරෙකු මෙම වාහනයේ රියදුරු ලෙස කටයුතු කිරිම නිසා මෙම ත්ත්ත්වය පැනනැගී තිබුණි. ආයතනයේ අවශ්‍යතා අනුව ඔහු කටයුතු නොකිරිම හේතුවෙන් ඔහුගේ කොන්ත්‍රාත් කාලය නිම විමත් සමඟ ආයතනයෙන් ඉවත් වී ඇත. | ගෙවීම් සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතු විම. |
| (vi) | මේ අනුව වාහනයේ පැහැදිලි හිමිකරු නොවන පුද්ගලයකු වෙත, විධිමත් අධිකාරී බලයක් ලබා නොගෙන, විධිමත් අනුමැතියකින් තොරව, අදාළ සේවාව ලබා ගැනීමට ප්‍රථම විධිමත් ඉන්වොයිස් පතක් නොමැතිව අධ්‍යක්ෂ මානව සම්පත් විසින් ගෙවීම් නිර්දේශ කර තිබුණි. එම නිර්දේශය පමණක් පදනම් කර ගෙන අනෙකුත් කරුණු කෙරෙහි සැලැකිල්ලක් නොදක්වා අධ්‍යක්ෂ මුල්‍ය විසින් වවුචරේ සඳහන් චෙක්පත් වටිනාකම ඉක්මවා ගෙවීම් කර තිබුණි. මෙසේ කර ඇති වවුචරයේ සඳහන් වටිනාකම රු.2,187,425 ක් වි තිබුණත් කොමිෂන් සභාවේ බැංකු ගිණුමෙන් රු.3,061,165 ගෙවා තිබුණි | මෙම ගෙවීම් මුදලින් සිදු කරන බැවින් එදිනට අදාළ අනෙකුත් ගෙවිම්ද ඇතුළත් කර චෙක්පත් ලියනු ලැබේ. ඒ නිසා මෙවැනි වෙනස්කම් ඇති වී ඇත. නමුත් මෙයට අදාළ වවුචර්ය මගින් නියමිත මුදල් පමණක් ගෙවා ඇත. | ඉහත පරිදි |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ ප්‍රගති වාර්තාව අනුව ක්‍රියාකාරකම් 05 ක කිසිදු ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණි. | 2021 වර්ෂය තුළදී අවශ්‍ය දත්ත නිසි පරිදි ඉදිරිපත් නොකිරීම නිසා 2021 වර්ෂයේදී ඉටු කිරීමට අපහසු විය. | අදාළ කාර්යයන් සැලසුමට අනුව සිදුකළ යුතු වීම |
| (ආ) | විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් 74 කින් ක්‍රියාකාරකම් 15 ක ප්‍රගතිය සියයට 30 කට වඩා අඩු මට්ටමක පැවති අතර, ඉන් ක්‍රියාකාරකම් 8 ක ප්‍රගතිය සියයට 10 කට වඩා අඩු අගයක පැවතුණි. | 2021 වර්ෂය තුළදී අවශ්‍ය දත්ත නිසි පරිදි ඉදිරිපත් නොකිරීම නිසා 2021 වර්ෂයේදී ඉටු කිරීමට අපහසු විය. | අදාළ කාර්යයන් සැලසුමට අනුව සිදුකළ යුතු වීම |
| (ඇ) | ක්‍රියාකාරී සැලැස්මට අනුව RA අංශය යටතේ හඳුනාගෙන තිබූ ක්‍රියාකාරකම් අංක AP21/CP/RA/26, 27, 28, 31 හා 32 ට අදාළව ප්‍රගතියක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබූ අතර, ඒ වෙනුවට නව කාර්යයන් ලෙස AP21/Pasindu/01, 02, 03, 04 හා 05 වශයෙන් කාර්යයන් 5 ක් ඛනිජතෙල් අංශයට අදාලව ක්‍රියාත්මක කර තිබුණි. | මෙම ක්‍රියාකාරකම් සියල්ල ඛනිජතෙල් අංශය සම්බන්ධ ක්‍රියාකාරකම් නිසා ඒවා හඳුනාගැනීම පිණිස මෙලෙස නම්කර ඇත. ඒ අනුව මෙම ක්‍රියාකාරකම් නිමකර අවශ්‍ය ප්‍රගතිය වර්ෂය තුළ ලබාගෙන ඇත. | අදාළ කාර්යයන් සැලසුමට අනුව සිදු කළ යුතු වීම |
| (ඈ) | මහජන උපයෝගිතා පනතේ 14(2) වගන්තිය ප්‍රකාරව ඉටුකළ යුතු කර්තව්‍යයන් සඳහන් කර තිබුණද, එම ක්‍රියාකාරකම් සිදු කිරීම වෙනුවට මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන වෙනුවෙන් සමස්ථ මෙහෙයුම් වියදම වූ රු.177,630,486 කින් රු.86,808,538 ක් එනම් සියයට 49 ක් වැය කර තිබුණි. එසේම එය ඉකුත් වර්ෂයට වඩා රු.74,976,422 ක එනම් සියයට 633 කින් පිරිවැය වැඩි වී තිබුණි. | 2019 අගෝස්තු 21 දින අමාත්‍ය මණ්ඩල තීරණය ඇමුණුම් අංකය 2-A හා ජනාධිපති ලේකම් කාර්යාලය විසින් මෙම ආයතනය වෙත ලබාදී තිබෙන 2022.06.27 දිනැති PS/COS/COM/2022 ඇමුණුම් අංකය 2-A-4 ලිපිය මත කාර්මික ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සිදුවීම හේතුවෙන් 2020 ට සාපේක්ෂව 2021 දී අතිරේක වශයෙන් වියදම් දැරීමට සිදුව තිබෙන බව සඳහන් කර සිටිමි. | අදාළ කාර්යයන් සැලසුමට අනුව සිදුකළ යුතු වීම. |